# <u>දැන්වීමයි</u>

**<u>කොන්ත්‍රාත් පදනමින් කළමනාකරණ සහකාර තනතුර සඳහා සේවකයන් බඳවා ගැනීම</u>**

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ MA 1-2 සේවා ගණය යටතේ පුරප්පාඩු වී පවතින කළමනාකරණ සහකාර තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත මාස 06 ක කාලයකට බාහිරින් සේවකයන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම් : (බාහිර)**

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) එකවර සමත්වී තිබීම සහ පළමු භාෂාව සහ ගණිතය විෂයය ඇතුළුව විෂයයන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම.

සහ

අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් විෂයයන් තුනක් (03) සමත්වී තිබීම

**වැටුප:**

| | |
|---|---|
| මූලික වැටුප | **- 43,312/-** |
| ජීවන වියදම් දීමනාව | **- 17,800/-** |
| ආහාර දීමනා | **- 3,600/-** |
| දිරි දීමනා | **- 1,000/-** |
| | **65, 712/-** |

**රාජකාරී වගකීම:** සංස්ථාවේ පවතින ඕනෑම කාර්යාලීය හා ඊට සමාන්තර අංශයක සියළුම ලිපිකරු රාජකාරී ඉටු කිරීම, පරිගණකය මගින් ලිපි සැකසීම (Word & Excel Document) විද්‍යුත් තැපැල භාවිතය / අන්තර්ජාලය පිරික්සීමේ හැකියාව.

**රැකියා ස්ථානය :** රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය, පානළුව, පාදුක්ක

ඒ අනුව ඉහත සුදුසුකම් සපුරා ඇති වයස අවුරුදු 18-45 අතර අය සිටීනම් තමන් විසින් සකස් කරගත් අයදුම්පත්‍රයක් සම්පූර්ණ කර ...2026.08.20....... දිනට පෙර කළමනාකරු (පරි.හා.මා.සම්.සං) රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පානළුව, පාදුක්ක යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ එම අංශය වෙත අතින් ගෙනවිත් භාරදීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

ටී.එම්.ඩී.එන්.උපිත බණ්ඩාර
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව